**පොල් පර්යේෂණ මණ්ඩලය-2013**

පොල් පර්යේෂණ මණ්ඩලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරිමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 43 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරිම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරිම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

2.1 මතය

මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට පොල් පර්යේෂණ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

**ප්‍රමිති අංක 01**

ප්‍රමිතියකින් ඉඩදී ඇති අවස්ථාවක හැර ආදායම හා වියදම එකිනෙකට හිලව්කර ගිණුම්ගත නොකළ යුතු නමුත් මණ්ඩලයේ විකුණුම් මධ්‍යස්ථානයේ රු.3,869,548 ක් වූ ආදායමට එරෙහිව රු.1,120,673 ක් වූ වියදම හා අනෙකුත් ආදායම් රු.11,560,125 කට එරෙහිව ඊට අදාල සාපේක්ෂ වියදම රු.2,896,530 ක් හිලව් කර ශුද්ධ ප්‍රතිඵලය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දක්වා තිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පර්යේෂණ කටයුතු සඳහා ප්‍රදාන වශයෙන් ලැබෙන මුදලින් ගොඩනගාගෙන ඇති වත්කම් නිශ්චිතව හඳුනාගැනීමටත් එම වත්කම්වල ක්ෂය ප්‍රමාණයන් ක්‍රමක්ෂය කිරීමටත් මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දුන්කන්නාව හා මිද්දෙණිය යන වතුවල ජීව විද්‍යාත්මක වත්කම්වල අගය තක්සේරු කර නොතිබූ අතර ඒ වෙනුවට 2012 වර්ෂයේ තක්සේරු කරන ලද වටිනාකම වූ රු.175,800 ක් ගිණුම්වල සටහන් කර තිබුණි.

(ඇ) අක්කර 05 ක විශාලත්වයක් වූ තබ්බෝව ගොවිපලෙහි ඉඩමේ වටිනාකම තක්සේරු කර වත්කමක් ලෙස මණ්ඩලයේ ගිණුම් පොත් වලින් අනාවරණය කර නොතිබුණි.

**3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මූල්‍ය සමාලෝචනය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.40,702,143 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ රු.59,537,758 ක ඌනතාවයක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.100,239,901 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. සමාලෝචිත වර්ෂයේ ආදායම් පෙර වර්ෂයට සාපේක්ෂව රු.117,889,178 කින් වැඩිවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් උපයාගත් ආදායමින් සියයට 67 ක් මෙහෙයුම් වියදම් සඳහා වැයකර තිබුණි.

(ආ) මණ්ඩලයේ සමස්ථ ආදායමින් සියයට 60 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් හා සියයට 40 ක් රජයේ ප්‍රදානයන්ගෙන් උත්පාදනය කරගෙන තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

වැලිගම කොළ කුණුවීමේ හා කොළ මැලවීමේ රෝග කාරකය ලෙස හඳුන්වන පයිටෝප්ලාස්මාව හඳුනාගත හැකි විශේෂිත RTPCR යන්ත්‍රයක් 2011 වර්ෂයේදී රු.මිලියන 6.3 කට මිලදී ගෙන තිබුණද සමාලෝචිත වර්ෂයේදී මාස 07 ක කාල පරිච්ඡේදයක් රසායන ද්‍රව්‍ය නොමැතිකම හේතුවෙන් සාම්පල් පරීක්ෂා කිරීමක් සිදුකර නොතිබුණි.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ)** පොල් මයිටා හානිය ජෛව විද්‍යාත්මකව පාලනය කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ විලෝපිත මයිටාවන් ක්ෂේත්‍රයට නිදහස් කිරීම සිදුකර තිබුණි. මයිටාවන් අභිජනනය කර බෙදාහැරීම සඳහා අභිජනන විද්‍යාගාර 12 ක් දිස්ත්‍රික්ක 07 ක පිහිටුවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) විලෝපිත මයිටා නිෂ්පාදනයේදී පොලිප්‍රොප්ලින් පැකට්වලට ආරම්භයේදී විලෝපිත මයිටාවන් 25 ක් පමණ හා අවශ්‍ය ආහාර එකතු කර සති 6 ක පමණ කාලයක් තබන අතර, මෙහිදී මයිටාවන් ගුණනය වී එක් පැකට්ටුවක මයිටාවන් 5,000 ක් පමණ ඇති වූ පසු ක්ෂේත්‍රයට නිදහස් කිරීමට සුදුසු ලෙස සලකනු ලබයි. මෙම පැකට් දින 6-8 ත් අතර කාලයකදී නිදහස් කළ යුතු වන අතර, එසේ නොහැකිවුවහොත් එම පැකට්වල සිටින විලෝපිත මයිටාවන් මඟින් අළුත් පැකට් නිෂ්පාදනය කිරීමට යොදාගත හැකි වේ. මේ හේතුවෙන් පැකට්වල නිෂ්පාදිත දිනය සඳහන් කළයුතු වුවත් එසේ සඳහන් කර නොතිබීම නිසා ක්ෂේත්‍රයට නිදහස් කිරීමට සුදුසු හා අළුත් පැකට් නිෂ්පාදනයට යොදාගත හැකි පැකට් මොනවාද යන්න හඳුනාගත නොහැකිව තිබුණි.

(ii) මයිටා රෝගය පැතිර ගොස් තිබුණු විශාල පොල් ගස් සංඛ්‍යාවක් 2014 ජුනි 10 දින අඹකැලේ ජාන සම්පත් මධ්‍යස්ථානයේ කරන ලද විගණන පරීක්ෂාවේදී දක්නට ලැබුණ අතර, විලෝපිත මයිටා, ගස්වල තැන්පත් කිරීම සඳහා දැරීමට සිදුවන පිරිවැයත් ඒවා මාස තුනකට වරක් තැන්පත් කිරීමට සිදුවීමත් හේතුවෙන් මෙම රෝගය මර්ධනය කර ගැනීමට නොහැකි වී තිබුණ බව නිරීක්ෂණය විය. මෙම විලෝපිත මයිටා පැකට් පොල්ගස් මත තැන්පත් කිරීමට යාන්ත්‍රික ක්‍රමයක් අනුගමනය කිරීමට අදහස් කර ඇති බැවින් ඉදිරියේදී මෙම අපහසුතාවය මග හැරී යනු ඇති බවට මේ සම්බන්ධයෙන් සභාපතිවරයා විසින් පිළිතුරු සපයා තිබුණි.

(ආ) පර්යේෂණ කටයුතු සඳහා දේශීය හා විදේශීය වශයෙන් ලැබෙන ප්‍රදාන වලින් අදාළ කාර්යය සඳහා යොදා නොගෙන ඉතිරිව පවතින මුදල් එම කාර්යයන් සඳහා ඵලදායීව යොදා ගැනීමට හෝ ප්‍රතිපූරණය කිරීමට කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට මෙසේ රඳවාගෙන තිබූ මුදල රු.6,897,514 ක් විය.

**4.4 කාර්යමණ්ඩල පරිපාලනය**

**------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 390 ක් වූ අතර, තථ්‍ය සේවක සංඛ්‍යාව 299 ක් විය. මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා අදාළ වන ජ්‍යෙෂ්ඨ, තෘතීයික හා ද්විතීයික මට්ටමේ තනතුරු පිළිවෙලින් 09 ක්, 20 ක් හා 47 ක් වශයෙන් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 22 ක් පුරප්පාඩුව පැවතිණි. නිලධාරීන් 07 දෙනෙකුගේ තනතුරු ඔවුනට පෞද්ගලික වන ලෙසත් ඔවුන් සේවයෙන් ඉවත්ව යන විට අහෝසි වන ලෙසත් අනුමත කර තිබුණි.

(ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2011 වර්ෂයේදී නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) තනතුරක් හා ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී තනතුරක් අනුමත කර තිබුණද 2014 මැයි 30 දින දක්වා එම තනතුරු පුරප්පාඩුව පැවතුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**------------------------------------------**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**--------------------------------**

2013 මාර්තු 05 දින ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන පරීක්ෂාවේදී අනාවරණය වූ රු.10,089,000 ක ගිණුම්කරණ අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානය යොමු කරන ලදී. එම අඩුපාඩු නිවැරදි කර සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2013 දෙසැම්බර් 26 දින නැවත ඉදිරිපත් කරන ලදී.

**6. පද්ධති හා පාලනයන්**

**-----------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) මානව සම්පත් කළමනාකරණය
(ඇ) භෝග සංරක්ෂණය